මුදල් අමාත්‍යාංශය
நிதி அமைச்சு
MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: TIP/SS/01/03
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2020.08.28

**වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක : 01/2020**

ජනාධිපති ලේකම්
අග්‍රාමාත්‍ය ලේකම්
අමාත්‍ය මණ්ඩල ලේකම්
අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
කොමිෂන් සභා ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්

**සහනදායි පදනම මත මෝටර් රථ බලපත්‍ර මගින් දේශීයව වාහන මිලදී ගැනීමේ පහසුකම් සැපයීමේ යෝජනා ක්‍රමය**

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2018 (සංශෝධිත) සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 (සංශෝධිත) යටතේ නිකුත් කර මෙතෙක් භාවිත කර නොමැති සහනදායී මෝටර් රථ බලපත්‍ර හිමියන් හට තම අභිමතය පරිදි මෙහි 1.2 වගන්තියේ සඳහන් කර ඇති ලියාපදිංචි වාහන අලෙවිකරුවෙකු වෙත තම බලපත්‍රය ලබා දී එම බලපත්‍රයේ සඳහන් බදු සහනය හා සමාන මුදලක් අඩු කරනු ලැබූ මිලකට මෙරට තුළ ඇති ලියාපදිංචි නොකල මෝටර් රථයක් මිලදී ගැනීමට මෙමගින් අනුමැතිය ලබා දෙනු ලැබේ.

**1. කොන්දේසි සහ ක්‍රියා පිලිවෙල**

1.1 වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2018 (සංශෝධිත) හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 (සංශෝධිත) යටතේ නිකුත් කර ඇති සහනදායී මෝටර් රථ බලපත්‍රය සහ එහි බැංකු පිටපත ලියාපදිංචි වාහන අලෙවිකරුවකු සන්තකයේ තබා එහි සඳහන් බදු සහනයට සමාන මුදලක් අඩු කරනු ලැබූ මිලක් යටතේ මෙරට තුල ඇති ලියාපදිංචි නොකල මෝටර් රථයක් ලබා ගැනීමට බලපත්‍ර හිමියාට අනුමැතිය හිමිවේ.

1.2 මෙම චක්‍රලේඛයේ ලියාපදිංචි වාහන අලෙවිකරුවකු යන්නෙන් වාහන ආනයනය කරන ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති මෝටර් වාහන ආනයන කරුවෙකු, විදේශ රටක නිපදවනු ලබන මෝටර් වාහන මෙරට බෙදා හැරීමේ බලය ලත් නියෝජිත වශයෙන් ලියාපදිංචි වී ඇති ආයතනයක් හෝ අළුත්ම මෝටර් වාහන කොටස් ආනයනය කර මෙරටදී එකලස් කර අලෙවි කිරීම සඳහා සමාගමක් ලෙස ලියාපදිංචි වී ඇති ආයතනයක් අදහස් වේ.

1.3 ඉහත පරිදි ලබා ගනු ලබන මෝටර් රථයේ / කැබ් රථයේ පළමු ලියාපදිංචිය බලපත්‍ර ලාභියා නමින් පමණක් සිදු කල යුතුය.

1.4 ලියාපදිංචි වාහන අලෙවිකරුවකුට පමණක් මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුව රේගු සංකේතාංක 87.03 හෝ 87.04 යටතේ වන මෝටර් රථ/කැබ් රථ පමණක් අලෙවි කිරීමට හැකියාව ඇත.

1.5 බලපත්‍රය මගින් දේශීය වෙළඳපලෙන් වාහනයක් ලබා ගනු ලබන සෑම බලපත්‍ර හිමියෙකුම මෙහි ඇමුණුම 1 හි සඳහන් ආකෘතියේ දිවුරුම් ප්‍රකාශයක් ඉහත 1.2 හි සඳහන් ආයතනයක් වන්නාවූ තමා මෝටර් රථය මිලදී ගනු ලබන ආයතනය වෙත ලබා දිය යුතුය.

1.6 මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන යටතේ බලපත්‍ර හිමියන්ට මෝටර් රථ අලෙවි කරනු ලබන ලියාපදිංචි වාහන අලෙවිකරුවකු විසින් ඉදිරියේදී මෝටර් රථ / කැබ් රථ ආනයනය කරනු ලබන විට වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන විශේෂ බලපත්‍රයක් මත අදාල බලපත්‍රයේ සඳහන් බදු සහනය ලබා දීමට ශ්‍රී ලංකා රේගුව විසින් කටයුතු කරනු ඇත.

1.7 ඉහත 1.6 හි සඳහන් පරිදි බදු සහන ලබා දීම සඳහා ඉදිරියේදී නිෂ්පාදන බදු විශේෂ විධිවිධාන පනත යටතේ වූ සංශෝධනයන් සිදු කෙරේ.

1.8 අදාල බදු සහනය ලබා ගැනීම සඳහා ලියාපදිංචි වාහන අලෙවිකරුවන් විසින් ණයවර ලිපි විවෘත කිරීමට ප්‍රථම තම භාරයේ ඇති මෝටර් රථ බලපත්‍ර, ඒවායෙහි බැංකු පිටපත් සහ දිවුරුම් ප්‍රකාශ ඇමුණුම 2 හි සඳහන් ආකෘතියට අනුව සකස් කරන ලද ඉල්ලීම් ලිපිය මගින් වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කල යුතු අතර එසේ සිදු කරනු ලබන ඉල්ලීම් පිලිබඳව සලකා බලා බදු සහනය සඳහා අනුමැතිය ලබා දෙනු ලැබේ.

1.9 ලියාපදිංචි වාහන අලෙවිකරුවන් විසින් ඉහත 1.6 හි සඳහන් පරිදි ආනයනය කරනු ලබන මෝටර් රථ/කැබ් රථ ඕනෑම අයෙකු නමින් ලියාපදිංචි කල හැකිය.

1.10 මෙම චක්‍රලේඛය යටතේ බලපත්‍ර හිමියා සහ ලියාපදිංචි වාහන අලෙවිකරු අතර ඇති කර ගනු ලබන එකඟතාවයන් අනුව කටයුතු කිරීම එම දෙපාර්ශ්වයේ වගකීමක් වන අතර ඒ සම්බන්ධයෙන් රජයේ බැඳීමක් නොමැත.

1.11 මෙම චක්‍රලේඛය, දැනට ක්‍රියාත්මක වාහන සඳහා වන ආනයන සීමාවන් ඉවත් කරනු ලබන තෙක් බලාත්මකව පවත්නා අන්තර්කාලීන විධිවිධානයක් පමණක් බව සැලකුව මැනවි.

1.12 මෙම චක්‍රලේඛය යටතේ වන විධිවිධාන උල්ලංඝණය කරනු ලැබීම් සම්බන්ධයෙන් රටේ පවතින සාමාන්‍ය නීතිය අනුව ක්‍රියා කරනු ඇත.

එස්.ආර්.ආටිගල
මහා භාණ්ඩාගාරයේ ලේකම් හා
මුදල් අමාත්‍යාංශයේ ලේකම්

පිටපත් :

| | | |
|---|---|---|
| 01. විගණකාධිපති | | - අ.ක.ස |
| 02. මහ බැංකුවේ අධිපති | | - අ.ක.ස |
| 03. අධ්‍යක්ෂ ජනරාල්, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති | | - ඉහත පරිදි කටයුතු කිරීම සඳහා |
| 04. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති | | - ඉහත 1.7 පරිදි කටයුතු කිරීම සඳහා |
| 05. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගුව | | - අ.ක.ස |
| 06. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා | | - අ.ක.ස |
| 07. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර | | - දැ.ගැ.ස |
| 08. කොමසාරිස් ජනරාල්, මෝටර් රථ ප්‍රවාහන | | - අ.ක.ස |
| 09. කොමසාරිස් ජනරාල්, දේශීය ආදායම් | | - දැ.ගැ.ස. |
| 10. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ විගණන | | - අ.ක.ස. |

ඇමුණුම 1

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2020 යටතේ වන දිවුරුම් ප්‍රකාශයයි

i) ........................................................................ හි පදිංචි ii) ............................................ වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජට iii)............................................ වශයෙන් අවංකවත්, සත්‍යගරුකවත් මෙසේ ප්‍රතිඥා දී සිටිමි.

ඉහත ප්‍රකාශක වන මම iv) ...................................... හි v) ........................................................................ හි vi) ...................................... වශයෙන් සේවය කරනු ලබන අතර මා හට vii) ............................ විසින් නිකුත් කරන ලද අංක viii) ............................ දරන ix) ........................ දිනැති x) රුපියල් ………… ක බදු සහනය සහිත සහනදායී මෝටර් රථ බලපත්‍රය මෙහි (1) හි විස්තර කරනු ලබන ආයතනය වෙත පවරා දී අංක (2) යටතේ විස්තර කර ඇති මෝටර් වාහනය මිලදී ගැනීමට එකඟ වන බව ප්‍රතිඥා දී ප්‍රකාශ කර සිටිමි. අදාල මෝටර් රථය ලියාපදිංචි කිරීමෙන් පසු එහි පිටපතක් වාහන අළෙවිකරු වෙත ලබා දීමට ද එකඟ වෙමි.

(1). මෝටර් රථය සපයනු ලබන ආයතනයේ නම ....................................
මෝටර් රථය සපයනු ලබන ආයතනයේ ලිපිනය ..................................
මෝටර් රථය සපයනු ලබන ආයතනයේ ලියාපදිංචි අංකය..........................
මෝටර් රථය සපයනු ලබන ආයතනයේ වැට් අංකය......................................
මෝටර් රථය සපයනු ලබන ආයතනයේ ටින් අංකය.........................................

(2) මෝටර් රථයේ චැසි අංකය
මෝටර් රථයේ එන්ජින් අංකය
මෝටර් රථයේ වර්ගය
මෝටර් රථයේ මාදිලිය
මෝටර් රථයේ වර්ණය
මෝටර් රථයේ වෙළඳපල වටිනාකම
මෝටර් රථය සඳහා එකඟ වන මිල

......................................................
දිවුරුම් ප්‍රකාශක

වර්ෂ ......................වූ දින දිවුරුම් ප්‍රකාශක විසින් කියවා තේරුම් ගෙන මා ඉදිරිපිටදී ප්‍රතිඥා දී අත්සන් තබන ලදී

......................................................
දිවුරුම් කොමසාරිස්
අත්සන හා නිල මුද්‍රාව

**විස්තරය**

i) ලිපිනය,
ii) සම්පූර්ණ නම,
iii) ආගම,
iv) අමාත්‍යාංශය/පළාත් සභාව/කොමිසම/විශේෂිත ආයතනය
v) දෙපාර්තමේන්තුව/ආයතනය (අදාල නොවන විට කඩ ඉරක් යොදන්න)
vi) තනතුර
vii) බලපත්‍රය නිකුත් කල ආයතනය හා නිකුත් කල බලධාරියා
viii) බලපත්‍ර අංකය
ix) බලපත්‍ර දිනය
x) බදු සහනයේ වටිනාකම රුපියල්

- දිවුරුම් ප්‍රකාශ ආකෘතියේ අන්තර්ගතයට විරුද්ධ නොවන යම් අමතර කරුණක් මෙහි යෙදිය යුතු යැයි දිවුරුම් කොමසාරිස් විසින් හඟින්නේ නම් මෙම ආකෘතියට හානියක් නොවන පරිදි එම කරුණු ඇතුලත් කල හැකිය.

අධ්‍යක්ෂ ජනරාල්
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

දිනය.........................

අධ්‍යක්ෂ ජනරාල් තුමණි

**වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 1/2020 අනුව බදු සහන ලබා ගැනීම**

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01-2018 / රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 යටතේ .............................. විසින් ..................................... පූජ්‍ය ප්‍රසාදීන් වහන්සේ/මහතා /මිය/මෙනවිය වෙත නිකුත් කරන ලද අංක ................... දරන ....................... දිනැති බලපත්‍රය මෙම ආයතනය සන්තකයට ගෙන මෙහි පහත සඳහන් වාහනය ඉහත බලපත්‍ර හිමියා වෙත අලෙවි කරනු ලැබීය.

මෝටර් රථය ආනයනය කිරීමට ඉදිරිපත් කල රේගු සටහන්කරයේ අංකය හා දිනය

මෝටර් රථයේ චැසි අංකය

මෝටර් රථයේ එන්ජින් අංකය

මෝටර් රථයේ වර්ගය

මෝටර් රථයේ මාදිලිය

මෝටර් රථයේ වර්ණය

මෝටර් රථයේ වෙළඳපල වටිනාකම

මෝටර් රථය අලෙවි කල මිල

බලපත්‍රය , එහි බැංකු පිටපත, ඇමුණුම 1 පරිදි සකසා බලපත්‍ර ලාභියා විසින් භාර දෙන ලද දිවුරුම් ප්‍රකාශය සහ බලපත්‍රය හිමිකරු වෙත විකුණනු ලැබූ මෝටර් රථයේ ලියාපදිංචි සහතිකයේ පිටපතක් මේ සමග ඉදිරිපත් කරමි.

අප ආයතනය විසින් මෝටර් රථයක් ආනයනය කිරීමට කටයුතු කරනු ලබන බැවින් ඉහත බලපත්‍රයේ සඳහන් බදු සහනය ලබා ගැනීම සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

මෙයට විශ්වාසී

...................................
අත්සන
අත්සන් කරන නිලධාරියාගේ නම
අත්සන් කරන නිලධාරියාගේ නිල නාමය හා නිල මුද්‍රාව

(මෙම ලිපිය අදාල ආයතනයේ ලිපි ශීර්ෂයක් මගින් බලය ලත් නිලධාරියාගේ නම, අත්සන නිල නාමය සහ නිල මුද්‍රාව සහිතව ඉදිරිපත් කල යුතුය).